# නර්තනය

## 9 ශ්‍රේණිය

## පිළිතුරු පත්‍රය

### I කොටස

01) iii
02) ii
03) ii
04). iv
05). i
06). E
07). D
08). A
09). B
10). C
11) තුන් වියත් තුන්ගුල
12). තිසර
13). විල්සන් ඔලබොඩුව
14). මහා වංශයේ
15). කෝලාට්ටම්
16). ii
17). i
18). iii
19). iv
20). ii

### II කොටස

01 i) මධ්‍යලය

ii) කඩතුරාව

iii) විගුස්සකී

iv) ලතා වල්පොල

v) කවිකාර මඩුවේ

vi) පාලමොට්ටායි

vii) ස්වස්ථානාවය

viii) කතාවක් කීම

02 i) සුලු මැදුම් දෙතිත (1+2) (1+2+3)
සුලු මහ දෙතිත (1+2) (1+2+3+4)
මැදුම් මහ දෙතිත (1+2+3) (1+2+3+4)

03 . i)

| ´1 | 2 | 3 | 4 | ´1 | 2 | 3 | 4 | ´1 | 2 | 3 | 4 | ´1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| + | + | රන් | - | දෑ | - | | - | කැ | - | ති | - | ගෙ | - | න | - |
| - | - | නි | ති | සැ | - | ර | - | සෙ | - | න | - | වා | - | - | - |

ii)

| ´1 | 2 | 3 | ´1 | 2 | 3 | ´1 | 2 | 3 | ´1 | 2 | 3 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ගත් | - | ත | තෙ | හි | ගු | ත | ක | ට | ත | කු | ඳ |
| තත් | කඩ | ජිත් | කඩ | තරි | කිට | ත | ක | ට | ත | කු | ඳ |
| ග | ත | කු | තෙ | හි | ගු | ත | ක | ට | ත | කු | ඳ |
| තා | - | තත් | කඩ | තරි | කිට | ජි | - | ජික් | කඩ | තරි | කිට |
| තොං | - | තොං | කඩ | තරි | කිට | නං | - | | | | |

03. i) පත්තිනි /විෂ්ණු /සමන් /කතරගම /නාථ/ දෙවොල් /වාහල/ විභීෂණු

ii) * ධන, ධාන්‍ය, ගව ,මහීෂාදී, භව භෝග ,සම්පත් වැඩිදියුණු කර ගැනීමට

* පුද්ගලයන්ට බලපෑ යම් රෝගාබාධයක් සුව කර ගැනීමට

* ගමකට ,රටකට ,ප්‍රදේශයකට ,පැමිණ ඇති ව්‍යසනයකින් මිදී සෙත්ශාන්තියක් ලබාගැනීමට

* අධ්‍යාපනික අවශ්‍යතා සඳහා

* සෞභාග්‍ය හා සශ්‍රීකත්වය ලබාගැනීම සඳහා

iii) වෛරය ,පළිගැනීම , ක්‍රෝධය යනාදී ක්‍රියාවන් මිනිසාගේ පරිහාණියට හේතුවන බවත් එවන් ක්‍රියාවන් වල නිරත වන පුද්ගලයින් හට අත්වන ඉරණමත් මෙමගින් පැහැදිලි වේ. තමා කරනා සෑම ක්‍රියාවක් පසුපසම කර්මය ලුහුබැඳ පැමිණෙන බවත්, පාපී ක්‍රියාවන් වලින් මිදී ,සමාජයේ යහපත් ලෙස ජීවත් වියයුතු බව මෙම උපත්කතා වලින් ලබාදෙන පණිවිඩය යි .(මේ හා සමාන පැහැදිලි කිරීමක් ඇත්නම් ලකුණු ලබාදෙන්න.)

04) i) A - කථක් නර්තනය B - කුලු නැටුමක්

ii) ප්‍රචලිත ප්‍රදේශ - මහාරාෂ්ට්‍රය /ගුජරාටිය / රාජස්ථානය / දිල්ලි / ලක්නව්

ප්‍රධාන වාද්‍ය භාණ්ඩය - තබ්ලාව

iii) කතක් නර්තනය උතුරු ඉංදියාවේ පාරම්පරිකව පැවත එන ශාස්ත්‍රීය නර්තන සම්ප්‍රදායකි. කතක් නර්තනය මුල් කාලවල දී හිංදු සංස්කෘතික ලක්ෂණ වලට අනුව ගොඩනැගුණු නමුත් මෝගල් අධිරාජයාගෙන් පසුව මුස්ලිම් ආභාෂය ලබමින් විවිධ විපර්යාසයන්ට ලක්විය. මේ අනුව ආගමික හා සමාජ සංස්කෘතික ලක්ෂණ වලට අනුකූලව නර්තනය ගොඩනැගෙන්නට ඇත. ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයම කථක් රඟදැක්වූ අතර රාජ සභාවන්හිදී ද දක්නට ලැබුණු බව සඳහන් ය..

05) i) පන් / ගොයම් / මෝල්ගස් / කුලු / ධීවර/ තේ / කෘෂි / පතල් / මැටි

ii) ▲ තාත්වික නාට්‍ය ▲ ශෛලීගත නාට්‍ය ▲ ගීත නාට්‍ය ▲ මුද්‍රා නාට්‍ය

iii) ▲ තාත්වික නාට්‍ය - යථානුරූපී ස්වභාවයෙන් ම ඉදිරිපත් කරන අතර නරඹන්නාට එය තමාගේ අත්දැකීමක් වශයෙන් විඳගැනීමට සලසන්නාවූ නාට්‍ය තාත්වික නාට්‍ය වේ.

▲ ශෛලීගත නාට්‍ය - ජීවිතයේ එදිනෙද දක්නට ලැබෙන විවිධ අවස්ථා හා සිද්ධි සැබෑ ස්වරූපයෙන් බැහැරව අතිශයෝක්තියෙන් වර්ණනා කෙරෙන නාට්‍ය විශේෂයක් ලෙස ශෛලීගත නාට්‍ය හැඳින්විය හැකි ය.

▲ ගීත නාට්‍ය - නාට්‍යට අදාළ සියලුම දෙබස් ගීතයෙන් ඉදිරිපත් කෙරෙන බැවින් එය ගීත නාට්‍ය නම් වේ.

▲ මුද්‍රා නාට්‍ය - වාචික අභිනයෙන් තොරව චලන මාධ්‍යයෙන් කිසියම් තේමාවක් පදනම් කොටගෙන නිර්මාණය කරන ලද, මුද්‍රා මගින් අදහස් ප්‍රකාශ කරන නට්‍ය මුද්‍රා නාට්‍ය නම් වේ.

06) i) වංශකතා / රූකම් / සෙල්ලිපි / සංදේශ කාව්‍ය / සහිත්‍යකෘති

ii) සෙල් ලිපි - පාලමොට්ටායි ලෙන් ලිපි - කොරවගගල

iii) විදෙන ලෙලෙන නරු බර පුළුලුකුල රැඳී ලකළ පුළුලුකුල බැඳී මිණි මෙවුල්ලා
හෙළන නගන අත නුවනග බැලුම් දිදී සමග රන් සළඹ රැව් දී වෙවුල්ලා
රැවින දිලෙන අබරණ කැලුම ගත යෙදී වයන පදට තබමින් පද කමල්ලා
සැලෙන පහන් සිළු වැනි රඟන ලිය සැදී රඟන ළඳුන් බල රූ සිරි සියල්ලා

07) **i) සතර බීජාක්ෂර**

සතර බීජාක්ෂර හා සරඹ පද වාදනය උඩරට , පහතරට ,සබරගමු යන නර්තන සම්ප්‍රදායන් තුනෙහිම බෙර පද දවුල් පද නිර්මාණය වී ඇත්තේ බීජාක්ෂර මුල් කරගෙන ය. එය පොදු වූ ධ්වනි සතරකි .එය බීජාක්ෂර ලෙස හැඳින්වෙන අතර ඒවා පදනම් කරගෙන උපදින අනෙකුත් අක්ෂර ගර්භාක්ෂර ලෙස හැඳින්වේ.

උඩරට සම්ප්‍රදාය - තත් ජිත් තොං නං

පහතරට සම්ප්‍රදාය - තත් දිත් තොං නං

සබරගමු සම්ප්‍රදාය -තත් ජිත් තොං නං

**ii) අලංකාර පද**

ශරීරයේ විවිධ කොටස් තාලයකටත් , රිද්මයටත් අනුව චලනය කිරීම නර්තනය වේ. අප ඉගෙන ගන්නා විවිධ නර්තන අතර ගොඩ ,සරඹ පා සරඹ යනාදිය සාම්ප්‍රදායික නර්තන ලෙස හැඳින්වේ. මෙම පා සරඹ , ගොඩ සරඹ සඳහා කැරකීම්, වාඩිවීම්, උඩපැනීම්, විවිධ දිශාලට ගමන් කිරීම ආදිය එක්කර නර්තන නිර්මණය කිරීමෙන් එම නර්තනයේ රසය වැඩි වේ. එසේ රසය වැඩි කරගත් නර්තන වල ඇතුළත් නර්තන පද අලංකාර මාත්‍රා ලෙස හැඳින්වේ

**iii) අර්නෝලිස් ඉඹුල්ගොඩ මහතා.**

අර්නෝලිස් ඉඹුල්ගොඩ මහතා 1968 දී ගලපිටමඩ ඉඹුල්ගොඩදී උපත ලද්දේය. මංගලතිරිය ගුරුතුමාගෙන් නර්තනය ගායනය ප්‍රගුණ කළ මෙතුමා අනතුරුව අල්ගම කිරිගණිතයා ගුරුතුමාගෙන් උඩරට නර්තනය හදාරා දක්ෂ නර්තන ශිල්පියෙක් බට පත්වි ය. 1951දී බෙන්තොට ගාමිණී විද්‍යාලයේ නැටුම් උපදේශකයෙකු ලෙසද ,1954 බලපිටිය ගුරු විදුහලේ නැටුම් කථිකාචාර්යවරයෙකු ලෙසද ,සේවය කළ අතිදක්ෂ නර්තන ශිල්පියෙකි. විජයාවතරණය ,උන්මාද චිත්‍රා ,ජානකීහරණය ,යන මුද්‍රා නාට්‍ය වල රඟපෑ මෙතුමා , 1957 දී උදාව , 1961 වේදනා , 1968 රන්දද නැමති මුද්‍රා නාට්‍ය නිර්මාණය කළේ ය. මෙතුමාගේ සුවිශේෂත්වය වන්නේ මෙතුමාටම ආවේණික වූ නර්තන ශෛලියක් ගොඩනගා ගැනීමයි . මෙතුමා කළ සේවය ඇගයීමක් ලෙස 1986 ජනාධිපතිවරයා අතින් කලාභූෂණ සම්මානයෙන් පිදුම් ලැබී ය.

## iv) සරානා (ගුරුකුල)

කථක් නර්තනය උගන්න ප්‍රධාන ගුරුකුල 4 කි. මෙම සරානා එක් එක් ප්‍රදේශ වල ප්‍රචලිත වූ අතර විවිධ පුද්ගලයන්ගේ දායකත්වය මත ගොඩනැගුණි .

- ▲ ලක්නව් සරානා - නවාබ් වජිද් අලීෂා 19 වන ශත වර්ෂයේ ගොඩනැගුණු සම්ප්‍රදායකි .
- ▲ ජායිපූර් සරානා - ජායිපූර් ප්‍රදේශයේ ගොඩනැගුණු සම්ප්‍රදායකි .
- ▲ බෙනාරිස් සරනා - බෙනාරිස් ප්‍රදේශයේ ගොඩනැගුණු සම්ප්‍රදායකි
- ▲ රායිසර් සරානා - රායිසර් ප්‍රදේශයේ ගොඩනැගුණු සම්ප්‍රදායකි .

## v) වන්නම්

වන්නමක් යනු වැනුමකි. උඩරට , පහතරට , සබරගමු යන සම්ප්‍රදායන් තුනෙහිම දක්නට ලැබෙන මෙම වන්නම් මුල් කාලයේ ගායනය සඳහා පමණක් නිර්මාණය විය. පසුකාලීනව නර්තනය යොදාගත් අතර උඩරට හා සබරගමු වන්නම් විනෝදාස්වාදය සඳහා නිර්මාණය වූ අතර පහතරට වන්නම් ආගමික භක්තිය දනවන විෂ්ණු දෙවියන්ගේ ගුණ වර්ණනා ඇතුළත් වේ . උඩරට වන්නම් 18 ක්ද , පහතරට වන්නම් 32 ක්ද , සබරගමු වන්නම් 21 ක්ද දක්නට ලැබේ. උඩරට වන්නමක කොටස් 6 ක් සහ පහතරට වන්නමක කොටස් 4 ක්ද , සබරගමු වන්නමක කොටස් 5 ක්ද ඇතුළත් වේ .